සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/07/SD/03/Hou.2026 | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2026.02.03 |

***සමෘද්ධි චක්‍රලේඛ අංක : 2026-09***

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**"සුවපහසු නිවසක් - සවිබලැති පවුලක්"**
**සමෘද්ධි නිවාස වැඩසටහන 2026/2027**

## 01. හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන වැඩසටහන ප්‍රජාව සවිබල ගැන්වීමයි. ඒ තුළින් ක්‍රියාවට නන්වන නිවාස වැඩසටහන වෙනුවෙන් ස්ථිරසාර වැඩපිළිවෙලක් දියත් කිරීමට ආරම්භ කරනු ලබන මෙම වැඩසටහන තුල පවුල් ලක්ෂ 20ක් වසර 05ක් තුල සවිබලගැන්වීමේ වැඩසටහන තුලින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. ස්ථිර නිවසක් ලබාදීමේ තිර අදිටනින් යුතුව මෙම වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. මේ යටතේ ස්ථිර නිවසක් නොමැති සවිබලගැන්වීමට නියමිත ප්‍රජාවට ස්ථිර නිවසක් ඉදිකර ගැනීමටද අවස්ථාව සලසනු ඇත. 2025/2026 වෙනුවෙන් නිකුත් කළ චක්‍රලේඛන උපදෙස් වලට අමතරව මෙම චක්‍රලේඛනය නිකුත් කරනු ඇත. සවිබල ගැන්වීමේ ඉලක්ක වැඩි දුරටත් සාක්ෂාත් කර ගැනීම මෙහි අරමුණ වේ.

එබැවින් ජීවත්වීමට නිවසක් නොමැති හා ආර්ථික දරිද්‍රතාවයෙන් පෙලෙන සවිබලගැන්වීමට නියමිත පවුල්වල නිවාස ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා එම පවුල් කෙරෙහි විශේෂ අවධානයක් යොමු

**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

කරමින් සහන සැලසීමට **විශේෂ නිවාස වැඩසටහන යටතේ "සුවපහසු නිවසක් - සවිබලැති පවුලක්" යන තේමාව ඔස්සේ** 2026/2027 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන අදියර කිහිපයකින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**විශේෂ නිවාස වැඩසටහන (රු. 1,000,000/- බැගින් ලබාදීම )**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ප්‍රතිලාභීන් තිදෙනෙකු බැගින් තෝරා ගැනීම සිදු කළ යුතු අතර සංශෝධන සිදු නොකිරීමට වග බලා ගත යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිටින ඉතාම දිළිඳු සවිබලගැන්වීමට නියමිත ලේඛනයේ අනිවාර්යයෙන්ම සිටිය යුතු පවුලක් සඳහා රු. 1,000,000/- බැගින් ලබා දීම සිදු කෙරේ. මෙහිදී අනිවාර්යයෙන් අපගේ නිර්ණායක අනුගමනය කරමින් සවිබලගැන්වීමට නියමිත පවුල් තුළින් ප්‍රමුඛතාවය ලැබිය යුතුම පවුල් තෝරා ගැනීම මෙහිදී සිදුකළ යුතු වේ. එලෙස සුදුසුකම් නොලබන පවුල් සඳහා නිවාස ඉදිකිරීමට අනුමැතිය ලබා නොදෙනු ඇත. මෙම පවුල් තෝරා ගැනීමේදී අනිවාර්යයෙන් මෙම නිවස තුල ආර්ථික කටයුත්තක් සිදු කර සවිබල ගන්වා පවුල් නඟාසිටුවීමට කටයුතු කළ යුතුය. ආර්ථික කටයුත්තක් ක්‍රියාත්මක කළ නොහැකි පවුල් තෝරා ගැනීමෙන් වැලකී සිටිය යුතුය. ඒ අනුව එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා නිවාස 03ක් ඉදිකිරීම වෙනුවෙන් රු.3,000,000/- ක් ලබාදීමට නියමිතය.

## 02. වැඩසටහන ක්‍රියාත්මක කිරීම

**1. සනාථ කර ගැනීමට අදාල නිර්ණායක**

නිවස සෑදීම සඳහා ස්ථිරව තමන් සතු ඉඩමක් තිබිය යුතුය. ඉඩමේ නිරවුල්භාවය පිළිබඳව පසුව ගැටළු මතුවුවහොත් එම යෝජනාව ප්‍රතික්ෂේප කර මුදල් ප්‍රධාන කාර්යාලයට ගනු ලබන අතර මොනම හේතුවක් නිසාවත් සංශෝධනය සඳහා අවස්ථාව ලබා නොදෙනු ඇත. සවිබලගැන්වීමට 2026 වසරේ තෝරාගත් පවුලක් විය යුතු අතර ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් සිදු කරන පවුලක්වීම අනිවාර්ය වේ. උදා - මැහුම් කර්මාන්තය, සිල්ලර කඩ, කෙටිකෑම සැකසීම (ඉදිආප්ප, පිට්ටු, ආප්ප වැනි), වින්කල් වැඩ, කොන්ඩා කැපීම, සංචාරක නේවාසික පහසුකම් සැලසීම ආදී කර්මාන්තයක් සිදුකළ යුතුය. පවුලේ සාමාජිකයින් 4 දෙනෙකුවත් (මව, පියා, දරුවන් දෙදෙනෙකු, ගැහැණු දරුවන් සිටින පවුල් කෙරෙහි වැඩි අවධානය) අනිවාර්ය වන අතර වැන්දඹු පවුලක් වීම හෝ ආබාධිත අයෙකු පවුලේ සිටීම (විශේෂයෙන් ගෘහ මූලික පිළිබඳව සලකා බලන්න) හෝ ආර්ථික මට්ටම සලකා බැලීමේදී දැඩි දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල තෝරා ගැනීම වඩාත් සුදුසුය. සුදුසුකම් සපුරාලීමට නොහැකි නිවාස යෝජනා ප්‍රතික්ෂේප විය හැකි බැවින් නිර්ණායක පිළිබඳව සැළකිලිමත්වීම අනිවාර්ය වේ. මීට අදාල නිවාස සැලැස්ම මේ සමඟ ඉදිරිපත් කර ඇති අතර ඉඩමේ පිහිටීම

අනුව එම නිවාස ආකෘතියට ගැලපෙන ආකාරයට නිවසේ ඉදිකිරීම් සිදු කර ගන්නා ලෙස දන්වමි. (2025 නිවාස වැඩසටහන සඳහා ද ඉදිරිපත් කර ඇත්තේ මෙම නිවාස ආකෘතිය බව සලකන්න.)

මේ සඳහා අදියර 03ක් යටතේ දිස්ත්‍රික් කාර්යාල මගින් ප්‍රජාමූල බැංකුව වෙත ප්‍රතිපාදන ලබාදෙන අතර එක් නිවසක් වෙනුවෙන් ලබාදෙන මුදල රු. 1,000,000/- කි. එක් වාරයකදී මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම සඳහන් ඡේදයට අනුව තුන් වතාවක් යටතේ ප්‍රතිලාභීන් වෙත මුදල් නිදහස් කළ යුතුය.

## II තෝරා ගැනීමේ ක්‍රියාවලිය

ඉහත කරුණු සඳහා මූලිකත්වය දෙමින්, නිවසක් නොමැති, නිවසක් ඉදිකර ගැනීමට හැකියාවක් නොමැති නමුත් නිවස ඉදිකර ගැනීමට තමා සතු ඉඩමක් හිමි සවිබලගැන්වීමට නියමිත පවුලක් විය යුතුය. තෝරා ගැනීමෙන් අංක 01 හි නිර්ණායක යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 03 බැගින් වන සේ තෝරාගත යුතුය.

**විශේෂයෙන් මෙම වැඩසටහන වෙනුවෙන් ලබාදෙන ආකෘති පත්‍රය මගින් පමණක්ම තොරතුරු ලබාදිය යුතු අතර මේ සඳහා වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී හා සමාජ සංවර්ධන නිලධාරී නිවස ඉදිකර අවසන් වන තෙක් වගකීම දැරිය යුතු වේ.**

නිවාස යෝජනා සඳහා තෝරා ගන්නා පවුල් ඒකකය සම්බන්ධයෙන් සම්පූර්ණ කරන තොරතුරු පත්‍රිකාවට අදාල තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ලබාගැනීම සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයාගේ වගකීම වේ. අදාල ආකෘති පත්‍රයෙන් තොරව එවනු ලබන යෝජනා ප්‍රතික්ෂේප කරනු ඇත. තවද විවිධ ආකෘති පත්‍ර හා විවිධ නම් වලින් එවනු ලබන යෝජනාද ප්‍රතික්ෂේප කරනු ඇත.

## III. මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වාරික නිදහස් කිරීමේ ක්‍රමවේදය :

මෙහිදී දිස්ත්‍රික් කාර්යාල මගින් ප්‍රජාමූල බැංකු වෙත එක් නිවසකට රුපියල් 1,000,000/- බැගින් අදියර 03ක් යටතේ ප්‍රතිපාදන ලබා දෙන අතර 2026 මැයි මාසයේ සිට මුදල් ලබාදෙනු ඇත. ප්‍රතිලාභීන් වෙත මුදල් නිදහස් කිරීමේදී අදියර 03 ක් යටතේ පහත පරිදි මුදල් ලබාදීම සිදු කළ යුතුය.

මෙහිදී දිස්ත්‍රික් කාර්යාලයෙන් යෝජනා ලැබෙන පිළිවෙල අනුව මුදල් ලබාදීම සිදු කරනු ඇත.

| අදියර | ලබාදෙන මුදල | අවසන් කළ යුතු වැඩ සීමාව |
|---|---|---|
| අදියර 01 | රු. 350,000.00 | අත්තිවාරම නිම කිරීම හා ලින්ටන් මට්ටම දක්වා නිම කිරීමට |
| අදියර 02 | රු. 300,000.00 | වහල මට්ටම දක්වා බිත්ති අවසන් කිරීම හා දොර ජනෙල් රාමු සවි කිරීම |
| අදියර 03 | රු. 350,000.00 | වහල නිම කිරීම, කපරාරුව සහ සිමෙන්ති දමා සියළු වැඩ අවසන් කිරීම |

මෙම ඉදිකරනු ලබන නිවාස සඳහා කාර්මික නිලධාරී නිර්දේශය අවස්ථා 02කදී ලබාගත යුතු අතර එය ඉදිකිරීම් ආරම්භක අවස්ථාව හා ඉදිකිරීම් අවසන් අවස්ථාවයි. ඉදිකිරීම් ආරම්භක අවස්ථාවේදී පරීක්ෂා කර බලා ඒ අනුව ක්‍රියාත්මක කිරීමට උපදෙස් හා මග පෙන්වීම් ලබාදිය යුතු අතර මූලික ගෙවීම් සඳහා නිර්දේශද ලබා දිය යුතුය.

ඉන්පසු තෙවන අදියර සඳහා මීට පෙර නිවාස ක්‍රියාත්මක කළ පරිදි කාර්මික නිලධාරී මගින් ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව ඒ ඒ අදියර අපේක්ෂා කළ ප්‍රමාණයට නිවාස ඉදිකිරීම් සම්පූර්ණ කර ඇති බවට මූලස්ථාන කළමනාකරු හා බැංකු සමිති කළමනාකරුගේ නිර්දේශ ලබාදීම කළ යුතුය.

අවසාන වශයෙන් නියමිත උපදෙස් පරිදි නිවස නිමකර ඇති බවට කාර්මික නිලධාරී මගින් ලිඛිත නිර්දේශ ලබාගැනීමෙන් අනතුරුව අවසන් ගෙවීම් සිදුකළ හැක. මෙය සෑම අවස්ථාවකදීම කාලය පිළිබඳව සැලකිල්ලට ගෙන කඩිනමින් කටයුතු නිම කිරීමට නිලධාරීන් විසින් අනලස්ව කටයුතු කළ යුතුය.

ජාතික වැඩසටහනක් ලෙස ඉතා ප්‍රමුඛත්වයක් දරමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළයුතු අතර සියළුම නිලධාරීන්ගේ කැපවීම හා මෙහෙයවීම මත සමාජයට අවශ්‍ය ප්‍රධාන මෙවලමක් වන හිසට නිවහනක් ලබාදීම සඳහා ඔබ දරන ප්‍රයත්නය වෙනුවෙන් දිස්ත්‍රික්කය වෙත වෙන්වන මුදලින් 1% ක පරිපාලන මුදලක් ඔබගේ පහසුව සඳහා වෙන් කර ඇත.

ඒ අනුව දිස්ත්‍රික් කාර්යාලය සඳහා 0.25%ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 0.75%ක් යොදා ගැනීමට හැකියාව ඇත. පරිපාලන වියදම්, වියදම් කිරීමේදී දිස්ත්‍රික්කයට ලැබෙන මුදල

පිළිබඳව අනිවාර්යයන්ම සැලකිල්ලට ගත යුතුය. (පසුව කිසියම් හෝ හේතුවක් මත ක්‍රියාත්මක නොවන නිවසක් වුවහොත් ඒ සඳහා පරිපාලන වියදම් ලබා ගත නොහැක.) මෙම අනුමත පරිපාලන වියදම ඔස්සේ ලිපිද්‍රව්‍ය, ඉන්ධන හා විශේෂ ගමන් වියදමක් වුවහොත් එයද කාර්මික නිලධාරී සඳහා යම් ගෙවීමක් ඉල්ලුම් කළහොත් උපරිම දින 2ක සංයුක්ත දීමනාවක්ද ගෙවීමට හැකියාව පවතී. කාර්මික නිලධාරීන් සඳහා ගෙවීම් කිරීමේදී එම නිලධාරීන්ගෙන් ලබාගන්නා ඉල්ලීම් ලිපියක් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් ගෙවීම් කළ හැක.

නිවාස ඉදිකිරීම සඳහා සවිබල ගැන්වීමට අදාල අනිවාර්යය ආර්ථික කටයුත්තක් සිදු කරන පවුලක් තෝරාගත යුතු අතර අවම වශයෙන් වර්ග අඩි 600ක් - 750ක් අතර නිවසක් ඉදිකල යුතුය. අපි විසින් දන්වා ඇති නිවාස ආකෘතියට අනුගතව ප්‍රතිලාභියාගේ ඉඩම් වපසරිය පිළිබඳව සැලකිල්ලට ගෙන නිවාස ඉදිකිරීම පිළිබඳව කටයුතු කළ යුතුය.

2026 දෙසැම්බර් මස 25 වන දිනට පෙර නිවාස ඉදිකිරිම අවසන් කර සියළු ගෙවීම් කටයුතු අවසන් කිරිමට කටයුතු කළ යුතුය. නමුත් ප්‍රතිපාදන ලබාදීම හා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු සලකා බලා දින දීර්ඝ කිරීමක් අවශ්‍ය වුවහොත් කටයුතු කරන බව වැඩිදුරටත් දැනුවත් කරමි.

මෙම නිවස ඉදි කිරීමේදී ප්‍රතිලාභියා සතු ඉඩමේ පිහිටීම අනුව ඔබ වෙත ලබාදී ඇති නිවාස සැලසුම අනුව සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. තවද විශාල අත්තිවාරම් දමා ගැනීමෙන් වැළකිය යුතුය. ඇතැම් දිස්ත්‍රික්කවල පූර්ව අත්දැකීම් මත නාය යාමට අදාල ප්‍රදේශ පිළිබඳව සැලකිල්ල දක්වා ඉඩම් තෝරාගත යුතු අතර ඒ ශ්‍රේණියේ ගොඩකරන ලද කුඹුරු ඉඩම් තෝරා ගැනීමෙන් වැළකිය යුතුය. 2026 වසර තුල පවත්නා ප්‍රතිපාදන සීමාව ඉතා අඩු මට්ටමේ පවතින හෙයින් දිස්ත්‍රික්ක වෙනුවෙන් ලබාදෙන නිවාස සංඛ්‍යාව අවම මට්ටමේ පවතී. එම නිසා තෝරා ගැනීමේදී විශේෂ සැලකිල්ල යොමුකර නිවාස තෝරාගැනීමට කටයුතු කරන මෙන් දැනුවත් කරමි.

ඒ අනුව මෙම වසරේ මෙම චක්‍රලේඛයට අනුව තම දිස්ත්‍රික්කයට අයත් නිවාස යෝජනා 2026 අප්‍රේල් 30 දිනට පෙර එකවර ලබා දිය යුතුය. වරින් වර ඉදිරිපත් කරනු ලබන නිවාස යෝජනා සඳහා දිස්ත්‍රික්කය වෙත මුදල් ලබාදීම සිදු නොකරන බව අවධාරණය කරමි.

තෝරාගත් නිවාස වල නිවස ඉදිකිරීමට පෙර ඡායාරූප හා නාමලේඛන පහත ආකෘතියට අනුව සකස් කර 2026.04.30 දිනට පෙර සමාජ සංවර්ධන අංශයේ ඊ මේල් ලිපිනය වන socialdivision54@gmail.com වෙත යොමු කරන්නේ නම් මැනවි.

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | ප්‍රජාමූල බැංකුව | ග්‍රා.නි. වසම | නම | ලිපිනය | තෝරා ගැනීමට හේතුව හා නියමිත ව්‍යාපෘතිය | වසම භාර නිළධාරියාගේ නම | දුරකථන අංකය | සමාජ සංවර්ධන සහකාර | දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

- ඉහත ආකෘතියට තොරතුරු ලබාදීමේදී අදාල නිලධාරීන්ගේ ක්‍රියාත්මක වන දුරකථන අංක ලබාදීමට කටයුතු කරන්න.
- නිවාස තෝරා ගැනීමේදී මෙම පවුල විසින් නව නිවස තුල ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතිය අනිවාර්යයෙන් සඳහන් කරන්න.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ලැබෙන නිවාස ඉල්ලීම් කමිටුවක් මගින් සම්මුඛ සාකච්ඡාවකට භාජනය කිරීමෙන් අනතුරුව තෝරා ගැනීම ඉතා සුදුසු ක්‍රමවේදයයි.
- එසේ තෝරා ගන්නා ලද යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හරහා ඉදිරිපත් කර කමිටුවේ නිර්දේශය ලබාගත යුතුය.
- අයදුම්පත් ලබාගැනීමේදී විනිවිදභාවයකින් යුතුව ලකුණුදීමේ සාධාරණ ක්‍රමයක් උපයෝගී කරගැනීම වැදගත් අතර ප්‍රතිලාභී තොරතුරු සත්‍ය බවට සනාථ කර ලබාගත යුතුය.

තවද මෙම තෝරා ගන්නා සෑම නිවසකම නිවසේ පෙර තත්ත්වය හා පසු තත්ත්වය සඳහන් ඡායාරූප ඔබ භාරයේ තබා ගත යුතු අතර නිවාස විවෘත කරන අවස්ථාවේදී එම වාර්තා ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. අයදුම්පත්‍රය සමඟ පුද්ගලයන්ගේ ඉල්ලීම් ලිපිය හා නිවසේ පෙර තත්ත්වය ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

මෙම සියළු නිවාසවල ප්‍රගතිය සෑම මසකම නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බැවින් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර වලට අනුව සෑම මසකම 05 වන දිනට පෙර සමාජ සංවර්ධන අංශයට ඊමේල් මගින් ලබාදිය යුතු බව අවධාරණය කරමි. මෙහිදී රු. 1,000,000/- නිවාස සඳහා ප්‍රගතිය ආකෘති පත්‍ර අනුව නියමිත දිනට වාර්තා කළ යුතුය. චක්‍රලේඛන උපදෙස් ප්‍රකාරව 2025/2026 හා 2026/2027 ලෙස වෙන වෙනම පැහැදිලිව නිවාස ප්‍රගතිය මාසිකව ඉදිරිපත් කළ යුතුය.

**අදාල වාර්තා නිවැරදිව ඉදිරිපත් නොකරන දිස්ත්‍රික්ක හා කලාප ප්‍රජාමූල බැංකු වලට ප්‍රතිපාදන ලබා නොදීමට කටයුතු කරනු ඇත. සෑම අදියරක් අවසානයේදීම වියදම් වූ මුදල් පිළිබඳව වාර්තාවක් ලබාදෙමින් ක්‍රියාත්මක නිවාස සඳහා පමණක් ඊළඟ අදියර වෙනුවෙන් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මුදල් ඉල්ලීම කළ යුතුය.** නිවාස ඉදිකිරීමේදී මෙම පවුල් ඒකක පිළිබඳ සමාජ සංවර්ධන සහකාරගේ පෞද්ගලික අවධානය යොමුකළ යුතු අතර ජීවනෝපාය හා බැංකු අංශය සම්බන්ධකර ගනිමින් එම පවුලේ ජීවන රටාව ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුන්වා දි මෙම පවුල සවිබලගැන්වීමට කටයුතු කළ යුතුය. 2026 වසරේ අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉලක්කය පවුල් සවිබලගැන්වීමේ වැඩසටහනයි. එම පවුල් සාමාජීය වශයෙන් අවශ්‍යතාවයක් වනුයේ නිවසක් ඉදිකිරීමට පහසුකම් ලබාදීමයි. එසේ නිවසක් ඉදිකිරීමෙන් එම පවුල දිරි ගැන්වීමයි. එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළයුතුය. සෑම ඉල්ලීමක්ම ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේදී හා ප්‍රගතිය ලබාදීමේදී අනිවාර්යයෙන් චක්‍රලේඛනයට අදාල වර්ෂය අනුව තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

සමෘද්ධි නිවාස වැඩසටහන සාර්ථක කර ගැනීමට අදාල නිලධාරීන් මෙහෙයවීම පිළිබඳ ස්තුතිවන්ත වන අතර මෙය ප්‍රමුඛ රාජකාරියක් ලෙස සලකා ඔබ සැමගේ සක්‍රීය දායකත්වය ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - දැ.ගැ.පි
02. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි .සං.දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.පි
04. අධ්‍යක්ෂ(ක්ෂුද්‍ර මූල්‍ය) - දැ.ගැ.පි
05. අධ්‍යක්ෂ(ජීවනෝපාය) - දැ.ගැ.පි
06. අධ්‍යක්ෂ(සමාජ සුභසාධන හා ආරක්ෂණ) - දැ.ගැ.පි
07. අධ්‍යක්ෂ(ප්‍රජාමූල හා ක්‍රීඩා) - දැ.ගැ.පි
08. අධ්‍යක්ෂ(අලෙවි) - දැ.ගැ.පි
09. අධ්‍යක්ෂ(සැලසුම්) - දැ.ගැ.පි
10. අධ්‍යක්ෂ(ප්‍රගති) - දැ.ගැ.පි